# ආහාර හා අපනයන කෘෂිකර්ම බෝග සහ විසිතුරු පැළෑටි පිළිබඳ ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය

2007 සැප්තැම්බර් 03

**කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය**

පටුන


හැඳින්වීම 1

අරමුණු හා පරමාර්ථ 2

ප්‍රතිපත්ති ප්‍රකාශන

1. කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම 2
2. බීජ හා රෝපණ ද්‍රව්‍ය 3
3. පොහොර 4
4. පළිබෝධ නාශක 4
5. කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ 5
6. වාරිමාර්ග හා ජල කළමනාකරණය 5
7. ඉඩම් පරිහරණය 6
8. පාංශු සංරක්ෂණය 6
9. කෘෂිකාර්මික ණය 6
10. කෘෂිකාර්මාක රක්ෂණය 7
11. කෘෂිකාර්මික පර්යේෂණ 7
12. කෘෂිකාර්මික ව්‍යාප්තිය සහ අධ්‍යාපනය 8
13. පසු අස්වනු තාක්ෂණය 8
14. අලෙවිකරණය 9
15. කෘෂි පාදක කර්මාන්ත 9
16. සාම්ප්‍රදායික කෘෂිකාර්මික බෝග සහ ක්‍රමවේද 10
17. ගෙවතු වගාව 10
18. කෘෂිකාර්මික ආයෝජනය 10
19. ආයතනික සංවර්ධනය 10
20. පැළෑටි ජාන සම්පත් උපයෝගිතාව සහ භුවමාරු කර ගැනීම 10
21. කෘෂිකර්මාන්තය කෙරෙහි තරුණ දායකත්වය 11
22. කෘෂිකාර්මික අපනයන 11

## හැඳින්වීම :

කෘෂිකර්ම අංශය ශ්‍රී ලංකා ආර්ථිකයේ අඩිතාලමයි. ජනගහණයෙන් 70% කට වඩා වැඩි පිරිසක් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වෙමින් තම ජීවිකාව සඳහා කෘෂිකර්මය මත යැපෙති. වර්තමානයේ මෙම අංශය දළ දේශීය නිෂ්පාදිතයෙන් 18% ක් පමණද, සේවා නියුක්තියෙන් 30% ක් පමණද දායක වේ. මෑත වසර වල ස්වයංපෝෂිත තත්වයට ළඟා වූ වී නිෂ්පාදනය හැරුණු විට කෘෂිකාර්මික ඵලදායිතාව සාපේක්ෂව ස්ථාවර මට්ටමක පවතී. දරිද්‍රතාවයෙන් පෙලෙන්නන්ගෙන් බහුතරය ග්‍රාමීය ප්‍රදේශ වල ජීවත්වීම මඟින් හා ජනගහනයෙන් 25-30% ක් අතර පිරිසක් පෙලෙන දරිද්‍රතාව මැඩලීමට අවහිරතා මතුවන්නේ මන්දැයි මේ මගින් යම් දුරකට පැහැදිලි වේ. ගොවිතැන් නොවන, වෙනත් මාර්ග වලින් ලබාගන්නා 60% ක අදායම් සමඟ සසඳා බැලූ විට අඩු ඵලදායිතාව සහිත කෘෂිකාර්මික අංශයද ගෘහස්ථ ආදායමෙන් 23% කට දායක වෙයි. (ආර්ථිකයේ අනිකුත් අංශ හා සාපේක්ෂව කෘෂිකාර්මික අංශය ග්‍රාමීය සේවා නියුක්ත කොටස් අන්තර්ග්‍රහණය සඳහා ප්‍රමාණවත් යෙදවීමක් නොවීය.) මෙම ප්‍රවණතාව වෙනස් කර විශේෂයෙන්ම ගොවි ප්‍රජාව ඇතුළුව සමස්ථ ජන ප්‍රජාවේම අපේක්ෂා සපුරාලීම පිණිස කෘෂි අංශය වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ. එමනිසා මෙරට ජනතාවගේ සමාජ ආර්ථික සෞභාග්‍යය ළඟා කරදීම සඳහා කෘෂි අංශයේ වර්ධනය වේගවත් කිරීමෙන් මෙම දැවැන්ත අභියෝග ජය ගනු පිණිස රජය විසින් මෙම අංශයේ සංවර්ධනය කෙරෙහි ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

රටෙහි සැලසුම්ගත සමාජ ආර්ථික සංවර්ධනයක් ඉලක්ක කරගත් ක්‍රමෝපාය භාවිතා කිරීමේදී කෘෂි අංශය අඛණ්ඩවම වැදගත් කාර්ය භාරයක් ඉටු කරනු ඇත. ජාතික මට්ටමින් ස්වායත්තතාව ළඟා කර ගැනීම, ආහාර සුරක්ෂිතතාව සහතික කර ගැනීම සහ දරිද්‍රතාව පිටු දැකීම සඳහා සාධාරණ ලෙස ආදායම් හා ධන ව්‍යාප්තිය ඇති කිරීම පිණිස විශේෂයෙන්ම දේශීය ආහාර නිෂ්පාදනය, මල් වගාව සහ අපනයන බෝග යන අංශ ඇතුළුව සමස්ත කෘෂිකාර්මික අංශයේම සීඝ්‍ර වර්ධනයක් සිදුවීම අත්‍යාවශ්‍යය.

මෙම ලේඛණය මඟින් ආහාර බෝග, අපනයන කෘෂි බෝග සහ මල් සහ විසිතුරු පැළෑටි යන අංශ වලට අදාළ ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්ති ප්‍රකාශ ඉදිරිපත් කරනුයේ එම අංශ වල පවත්නා බොහෝමයක් ගැටලු නිරාකරණය කර ගැනීම හා සීඝ්‍ර වර්ධනයක් ඇති කර ගැනීම අරමුණු කර ගනිමිනි. මෙහි අඩංගු ප්‍රතිපත්තීන්හි සඳහන් වන පරමාර්ථ සැලසුම් කර ඇත්තේ තාක්ෂණික වශයෙන් පරිපූර්ණ සමාජීය වශයෙන් පිළිගත හැකි ආර්ථිකමය වශයෙන්

සාධාරනිය එමෙන්ම පාරිසරික වශයෙන් හිතකර කෘෂි නිෂ්පාදන තාක්ෂණයන් භාවිතා කිරීම මගින් ආහාර හා පෝෂණ සුරක්ෂතාව, වැඩි රැකියා අවස්ථා සහ වැඩි ආදායම් හිමිකර ගැනීමට සහ අලෙවිකරණය හා ඒ ආශ්‍රිත ගැටලු නිරාකරණය කර ගැනීමට ගොවි ප්‍රජාව තුළ පවතින මූලික අවශ්‍යතා සපුරාලීම පිණිසය.

## අරමුණු හා පරමාර්ථ

1. ජාතික ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව සහතික කිරීම පිණිස දේශීය කෘෂිකාර්මික නිෂ්පාදනය වර්ධනය කිරීම.
2. කෘෂිකාර්මික ඵලදායිතාව ප්‍රවර්ධනය සහ තිරසාර වර්ධනයක් සහතික කිරීම.
3. දේශීය හා අපනයන කෘෂිකර්මය කෙරෙහි ගෝලියකරණය නිසා ලැබෙන ප්‍රතිලාභ උපරිම කිරීම හා අහිතකර බලපෑම අවම කිරීම.
4. ඒකක නිෂ්පාදන පිරිවැය අඩු කිරීමේ හා ලාභ වැඩි කිරීමේ අරමුණෙන් ඵලදායී ගොවිතැන් ක්‍රම සහ වැඩි දියුණු කළ කෘෂි තාක්ෂණයන් භාවිතය.
5. කෘෂිකර්මයේදී පරිසරයට හිතකර හා සෞඛ්‍යයට හානිදායක නොවන තාක්ෂණ ක්‍රම භාවිතා කිරීම.
6. කෘෂි පාදක කර්මාන්ත ප්‍රවර්ධනය සහ රැකියා අවස්ථා වැඩි කිරීම.
7. ගොවි ප්‍රජාවේ ආදායම හා ජීවන තත්ත්වය ඉහළ නැංවීම.

## ප්‍රතිපත්ති ප්‍රකාශනය

1. කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම

1.1. පවත්නා සම්පත් උපරිම අයුරින් උපයෝජනය කිරීම සහතික කිරීම පිණිස පියවර ගැනීම මගින් තිරසාර කෘෂිකාර්මික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම පිණිස තාක්ෂණික වශයෙන් පරිපූර්ණ, ආර්ථිකමය වශයෙන් සාධනීය, පාරිසරික වශයෙන් හිතකර සහ සමාජීය වශයෙන් පිළිගත හැකි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

1.2. වී, වෙනත් ක්ෂේත්‍ර බෝග, උද්‍යාන බෝග, මල් සහ විසිතුරු පැලෑටි, මුල් සහ ආකන්ද බෝග, අපනයන කෘෂි බෝග, ඖෂධීය බෝග, වෙනත් ඌන භාවිත බෝග වගාව සහ මී මැසි පාලනය මෙන්ම වෙනත් උක්, කජු, පොල් වැනි පරිභෝජන බෝග කෙරෙහි අවධානය යොමු කිරීම මඟින් දේශීය ආහාර සැපයුම, රැකියා අවස්ථා සහ කෘෂි අපනයන වර්ධනය කිරීම.

1.3. සුදුසු වගා ක්‍රම භාවිතා කර බෝග නිෂ්පාදනය වැඩි කර ගැනීමෙන් ජලයේ හා ඉඩම් වල ඵලදායිතාව වර්ධනය කිරීම.

1.4. තිරසාර කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා ඒකාබද්ධ පළිබෝධ කළමණාකරණය හා ඒකාබද්ධ පැලෑටි පෝෂක කළමණාකරණය වැනි යෝග්‍ය කෘෂිකාර්මික පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම.

1.5. කෘෂිකර්මයට අදාල ඒකාබද්ධ ලෙස සත්ව පාලනය, ජලජීවී වගාව වැනි ආදායම් මාර්ග අනුගමනය ප්‍රවර්ධනය කිරීම.

1.6. පෝෂණ අවශ්‍යතා හා වෙළඳපොළ ඉල්ලුමට සරිලන ලෙස නිෂ්පාදන සැලසුම් සකස් කිරීම.

1.7. කෘෂි දේශගුණික සාදක පදනම් කරගත් බෝග වගාව හා කෘෂිපාදක කර්මාන්ත සඳහා යොමු වීම.

1.8. උසස් හා නවීන තාක්ෂණයන් හැකි සෑම විටම ගමට ගෙන යාම.

2. බීජ හා රෝපණ ද්‍රව්‍ය

2.1. පෞද්ගලික අංශයේ හා රාජ්‍ය අංශයේ සහභාගිත්වයෙන් වාණිජමය ප්‍රභේද වල උසස් ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය තරඟකාරී පරිසරයක් තුළ සැපයීම.

2.2. නිර්දේශිත ප්‍රභේද වල සහතික කළ බීජ ආරක්ෂණ තොග පවත්වා ගෙන යාම මඟින් බීජ සුරක්ෂිතතාව තහවුරු කිරීම.

2.3. බීජ හා රෝපණ ද්‍රව්‍ය සහතික කිරීම සහ නිරෝධායන සම්බන්ධයෙන් පවත්නා රාජ්‍ය විධිවිධාන දැඩිව ක්‍රියාවට නැංවීම.

2.4. වෙළඳ පොලෙහි උසස් තත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය පමණක් පවත්නා බවට සහතික කිරීම.

2.5. එක් වරක් පමණක් භාවිතා කල හැකි ජාන (Terminator gene) සහිත බෝග ප්‍රභේද ආනයනය අධෛර්මත් කිරීම.

3. පොහොර

3.1. කාබනික හා ජෛව පොහොර නිෂ්පාදනය සහ භාවිතය ප්‍රවර්ධනය කිරීම සහ රසායනික පොහොර භාවිතය ක්‍රමයෙන් අඩු කිරීම.

3.2. ගොවිපළ විශේෂිත වූ ප්‍රශස්ථ පොහොර භාවිතය සඳහා පාංශු හා පැළෑටි පරීක්ෂණ කටයුතු ප්‍රවර්ධනය කරන අතරම අකාබනික පොහොර නිසි වේලාවට ප්‍රමාණවත් පරිදි සැපයීම සහතික කිරීම.

3.3. අමිශ්‍ර පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීම.

3.4. දේශීය වශයෙන් ලබාගත හැකි අමුද්‍රව්‍ය යොදා ගනිමින් රසායනික පොහොර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම.

3.5. පොහොර සහනාධාරයෙන් අයුතු ප්‍රයෝජන ගැනීම වැලැක්වීමට කටයුතු කිරීම.

4. පළිබෝධ නාශක

4.1. ජෛව පළිබෝධ නාශක ප්‍රචලිත කිරීම සහ ඒකාබද්ධ පළිබෝධ කළමණාකරණය මඟින් කෘත්‍රිම පළිබෝධ නාශක භාවිතය අවම කිරීම.

4.2. පළිබෝධ නාශක ආශ්‍රිත සෞඛ්‍යමය හා පාරිසරික අවදානම් අවම කිරීම පිණිස ඒවා බෙදා හැරීමට හා භාවිතයට අදාළව ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් පනවන ලද අන්තර්ජාතික පිළිවෙත් මාලාවට අනුකූලව, පළිබෝධ නාශක නියාමක ක්‍රමය සාර්ථක අයුරින් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් ආයතනික හා යටිතල පහසුකම් ලබාදීම.

4.3. රාජ්‍ය හා පෞද්ගලික අංශ සහභාගීත්වය යටතේ පරිසරයට හිතකර ජෛව පළිබෝධ නාශක නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම.

4.4. විදේශීය වල් පැළෑටි, කෘමීන්, පළිබෝධ හා රෝග මෙරටට පැමිණීම වැළැක්වීම සඳහා පැළෑටි ආරක්ෂණ විධිවිධාන දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම.

4.5. පළිබෝධ නාශක සම්බන්ධ රසායනික ද්‍රව්‍ය ආනයනයේදී දැඩි ලෙස පරීක්ෂණ විධිවිධාන ක්‍රියාත්මක කිරීම.

5. කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ

5.1. කෘෂි අංශය සඳහා යෝග්‍ය තාක්ෂණයෙන් යුත් කෘෂිකාර්මික යන්ත්‍රසූත්‍ර වැඩි දියුණු කිරීම හා නිපදවීම පිණිස රාජ්‍ය හා පෞද්ගලික අංශ මෙන්ම විශ්වවිද්‍යාල දිරිමත් කිරීම.

5.2. වඩා කාර්යක්ෂම හා පිරිවැයට සරිලන ප්‍රතිලාභ ගෙන දෙන්නක් බවට කෘෂිකර්මාන්තය පත් කිරීම පිණිස යාන්ත්‍රිකරණය ප්‍රවර්ධනය කිරීම.

5.3.ලාභදායි ලෙස කෘෂිකර්මය පවත්වා ගෙන යාමට බවහල් වන නවීන හා සූක්ෂම තාක්ෂණයෙන් යුත් අඩු පිරිවැයැති උසස් තත්ත්වයේ යන්ත්‍රෝපකරණ සම්පාදනය සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශය දිරිමත් කිරීම.

6. වාරිමාර්ග හා ජල කළමනාකරණය

6.1. කෘෂිකර්මාන්තයේදී ඉහළ ඵලදායිතාවයක් සාක්ෂාත් කර ගැනීම පිණිස කාර්යක්ෂම ජල කළමණාකරණය සහ තෙතමනය රඳවා ගැනීමේ ක්‍රම භාවිතය දිරිගැන්වීම.

6.2. තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයක් සඳහා පවතින ජල සම්පත් සංරක්ෂණය කිරීම.

6.3. ජල සංරක්ෂණය, වසුන් යෙදීම සහ සුදුසු වෙනත් ක්‍රම තුළින් වර්ෂාපෝෂිත කෘෂිකර්මාන්තයේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම.

6.4. වාරිමාර්ග හා ජලවහන පද්ධති නඩත්තු කිරීමේදී හා වැඩිදියුණු කිරීමේදී සහභාගිත්ව වාරිමාර්ග කළමණාකරණය ප්‍රවර්ධනය කිරීම.

6.5. ස්වභාවික ව්‍යසන හේතුවෙන් සහ භාවිතයේදී ඇති වන හානි වලින් වාරි ජලාශ, ඇල මාර්ග සහ නිර්මිතයන් ආරක්ෂා කර ගැනීම.

6.6. කෘෂිකර්මය හෝ කර්මාන්ත වලින් ජලය අපවිත්‍ර වීම වැලැක්වීම.

6.7. වැසි ජලය හා භූගත ජලය සංරක්ෂණය කිරීමට පියවර ගැනීම.

6.8. ජල භාවිත කාර්යක්ෂමතාව වැඩි කිරීම හා සංරක්ෂණය සඳහා නවීන හා සූක්ෂම තාක්ෂණයන් භාවිතයට නැඹුරු කරවීම.

7. ඉඩම් පරිහරණය

7.1. කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් භාවිතයේදි ජාතික ඉඩම් ප්‍රතිපත්තියට අනුකූල විම.

7.2. මුඩු, නිසරු සහ ඛාදනය වූ ඉඩම් වල උපරිම භාවිතයත්, හේන් වගාව කෙරෙන ඉඩම් ඉහළ ඵලදායිතාවයක් ලබාගැනිම සඳහා බෝග වගාව, සත්ව පාලනය හෝ වන වගා මඟින් උපරිම භූමි පරහරණය සහතික කිරිම.

7.3. ඉඩම් හා කෘෂිකර්මයට අදාල ආයතන ඒකාබද්ධව කටයුතු කිරිම තහවුරු කිරිම.

7.4. ජල පෝෂක ප්‍රදේශ වල ඉඩම් සංරක්ෂණය සඳහා කටයුතු කිරිම.

7.5. ඉඩම් භාවිතය සඳහා බලපත්‍ර ලබා ගැනිම අනිවාර්ය කිරිම.

7.6. ඉඩම් භාවිතය කාර්යක්ෂම කිරිම සඳහා යටි වගාවන් හා මිශ්‍ර වගාවන් ඇති කිරිමට නැඹුරු කිරිම.

8. පාංශු සංරක්ෂණය

8.1. මනා පාංශු සංරක්ෂණයක් සහතික කිරිම සඳහා පාංශු සංරක්ෂණ පනතේ දැක්වෙන විධිවිධාන ක්‍රියාත්මක කිරිම.

8.2. තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයක් සඳහා පාංශු සංරක්ෂණයේ වැදගත්කම සම්බන්ධයෙන් ගොවි ප්‍රජාව දැනුවත් කිරිම.

9. කෘෂිකාර්මික ණය

9.1. ගොවින්ගේ ආයෝජන, ඉතිරි කිරිම් සහ අවදානම් කළමණාකරණය සම්බන්ධයෙන් පවත්නා ග්‍රාමිය ණය ආයතන ශක්තිමත් කිරිම.

9.2. කෘෂිකාර්මික කටයුතු සහ කෘෂි පාදක කර්මාන්ත වලට ණය පහසුකම් බෙදා දිමේදි සරළ ක්‍රියාමාර්ග හඳුන්වාදිම.

9.3. ගොවින්ට සහන පොළී අනුපාත යටතේ ණය ලබාදිම තහවුරු කිරිම.

9.4. ගොවි ප්‍රජාවගේ යහපත උදෙසා රජයේ බැංකු වලින් ලබාදෙන මුළු ණය ප්‍රමාණයෙන් අනිවාර්ය කොටසක් කෘෂිකාර්මික ණය ලබාදිම සඳහා වෙන් කිරිමට පියවර ගැනිම.

9.5. ගොවිසෙත අරමුදල ඵලදායි ලෙස වගා ණය ක්‍රියාවලියට යෙදවිම.

10. කෘෂිකාර්මික රක්ෂණය

10.1. ස්වභාවික ව්‍යසනයන්ගේ අවදානමින් ගොවින් සුරක්ෂිත කිරිමට යෝග්‍ය කෘෂිකාර්මික රක්ෂණ යෝජනා හඳුන්වා දිම.

11. කෘෂිකාර්මික පර්යේෂණ

11.1. ජීවන වෘත්තීන් වැඩි දියුණු කිරීම, ආහාර සුරක්ෂිතතාව ළඟා කර ගැනීම, කෘෂිපාදක කර්මාන්ත ඉහළ නැංවීම හා කෘෂි අංශය ගෝලීය අභියෝග වලට මුහුණ දියහැකි ලෙස සුදානම් කිරීම යන කරුණු වෙත කෘෂිකාර්මික පර්යේෂණ හා සංවර්ධන කටයුතු යොමු කිරීම.

11.2. කාර්යක්ෂම කෘෂිකාර්මික නිෂ්පාදනය සහ පාරිසරික සංරක්ෂණය සඳහා ජෛව තාක්ෂණය, භූගෝලීය තොරතුරු ක්‍රම තාක්ෂණය, පෙර හා පසු අස්වනු තාක්ෂණය, නැනෝ තාක්ෂණය වැනි නවීන තාක්ෂණයන් භාවිතා කිරීම.

11.3. පෞද්ගලික අංශය, විශ්ව විද්‍යාල, ගොවි සංවිධාන, නිෂ්පාදකයින්ගේ සංවිධාන සහ අදාළ වෙනත් හවුල්කරුවන් සමඟ එක්ව ගැටලු නිරාකරණය අරමුණු කර ගත් සහයෝගිතා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.

11.4. කෘෂිකාර්මික පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන ප්‍රවර්ධනය කිරීම.

11.5. තාක්ෂණය යොදා ගැනීමේ කල්පමාව වළක්වා ගැනීම පිණිස පර්යේෂණ වල සොයා ගැනීම් කඩිනමින් අවසන් පරිශීලකයන්ට බෙදා හැරීම පිණිස ක්‍රමෝපාය සකස් කිරීම.

11.6. කෘෂිකාර්මික කටයුතු වලින් පරිසරයට හා සෞඛ්‍යයට වන බලපෑම් නිරතුරුව විපරම් කිරීම සඳහා අඛණ්ඩව පර්යේෂණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

11.7. සමාජීය අවශ්‍යතා, කම්කරු හිඟය වැනි සාදක සලකනු ලබන බෝග අභිජනන වැඩසටහනකට අවතීර්ණ වීම.

12. කෘෂිකාර්මික ව්‍යාප්තිය සහ අධ්‍යාපනය

12.1. ගොවි ප්‍රජාව වෙත නව සොයා ගැනීම් සහ තොරතුරු බෙදාහැරීම පිණිස පවතින ව්‍යාප්ති ක්‍රමය ප්‍රතිසංවිධානය කිරීම සහ ශක්තිමත් කිරීම.

12.2. ගොවි ප්‍රජාව වෙත ඵලදායි අයුරින් තොරතුරු බෙදාහැරීම සඳහා නූතන තොරතුරු සන්නිවේදන තාක්ෂණය හඳුන්වා දීම.

12.3. පර්යේෂණ හා ව්‍යාප්ති කටයුතු අතර ඇති කෙරෙන ඵලදායි සබඳතාවයක් තුළින් යාවත්කාලීන කළ තාක්ෂණයන් බෙදාහැරීමේදී හා භාවිතයේදී හවුල්කරුවන් වශයෙන් ගොවීන්ගේ හා ප්‍රජා මූලික සංවිධාන වල ක්‍රියාකාරී සහභාගීත්වය සහතික කිරීම.

12.4. කෘෂි අංශයේ වර්තමාන හා අනාගත ඉල්ලුම සපුරාලනු පිණිස කෘෂිකර්ම පාසැල් වල සහ කෘෂිකර්මය හා සම්බන්ධ අනිකුත් පුහුණු ආයතන වල විෂය නිර්දේශ සහ පාඨමාලා නැවත සැලසුම් කිරීම හා නවීකරණය කිරීම.

12.5. කෘෂිකාර්මික විද්‍යාඥයින්ගේ හා ගොවීන්ගේ නිපුණතා සංවර්ධනය පිණිස මෙරට හා විදේශ පුහුණු අවස්ථා සලසා දීම.

13. පසු අස්වනු තාක්ෂණය

13.1. දේශීය හා අපනයන වෙළඳපොල ඉල්ලුම සපුරාලීම පිණිස නිෂ්පාදන වල තත්වය වැඩිදියුණු කර ගැනීම සඳහාත්, පෙර හා පසු අස්වනු හානි අවම කර ගැනීමේ අරමුණෙන් අස්වනු නෙලීම, සැකසුම් කිරීම, අගය එකතු කිරීම, ගබඩා කිරීම හා ප්‍රවාහනය සඳහා වඩා උචිත ක්‍රම සොයා ගැනීම සහ ප්‍රචලිත කිරීම.

13.2. පසු අස්වනු සැලසුම් ක්‍රියාවලියේදී හා කෘෂි නිෂ්පාදන වලට අගය එකතු කිරීමේදී ස්වස්ථතා සහ උද්භිත ස්වස්ථතා පියවර ක්‍රියාත්මක කරලීම.

13.3. නවීන සැකසුම් හල් හා යන්ත්‍රෝපකරණ භාවිතය වෙනුවෙන් දිරි දීමනා ලබා දීම.

14. අලෙවිකරණය

14.1. මිල ස්ථායි කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී සමුපකාර හා වෙනත් රාජ්‍ය මැදිහත්වීමක් තුළින් කෘෂි නිෂ්පාදන අලෙවිකරණය ආශ්‍රිත ගැටලු අවම කර ගැනීම.

14.2. කෘෂි නිෂ්පාදන අලෙවිකරණය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම පිණිස පෞද්ගලික අංශයේ ආයෝජන ප්‍රවර්ධනය කිරීම.

14.3. ඉහළ අපනයන විභවයන් සහිත බෝග සඳහා විදේශ වෙළඳපොල ගවේෂණය සහ ප්‍රවර්ධනය.

14.4. තරඟකාරී වෙළඳපොල වලට පිවිසීම සඳහා නිෂ්පාසන නාමකරණය සහතික කිරම හා භූගෝලීය දර්ශක භාවිතය දිරි ගැන්වීම.

14.5. දිස්ත්‍රික් මට්ටමින් කෘෂි ව්‍යාපාර මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම මඟින් අලෙවිකරණ තොරතුරු බෙදාගැරීම සහ අලෙවිකරණ මෙහෙයුම් කටයුතු පහසු කිරීම.

14.6. දැනට ඇති බහුපාර්ශවික හා ද්විපාර්ශවික වෙළඳ ගිවිසුම් වලට ගැලපෙන සේ කෘෂි අංශය සුදුසු පරිදි නැඹුරු කිරීම.

14.7. උසස් ගුණාත්මයෙන් යුත් ප්‍රථමික නිෂ්පාදිතයන් නිෂ්පාදනය කිරීම සඳහා ගොවීන් යොමු කිරීම.

14.8. අලෙවි ක්‍රියාවලිය සඳහා ප්‍රජා සංවිධාන වල මැදිහත් වීම ප්‍රවර්ධනය.

14.9. සුළු ගොවීන්ගේ අවශ්‍යතා සපුරාලීම උදෙසා වූ කෘෂි ව්‍යවසායකත්ව අවස්ථා හඳුනා ගැනීම සහ එවැනි ව්‍යාපාරයන්හි රාජ්‍ය හා පෞද්ගලික ආයෝජනය ප්‍රවර්ධනය කිරීම.

14.10. කෘෂිකාර්මික සැකසුම්කරණයෙහි සහ අලෙවිකරණයෙහි නිෂ්පාදකයින්ගේ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම.

14.11. කාර්යක්ෂම කෘෂි නිෂ්පාදන අලෙවි ක්‍රමයක් සඳහා සැපයුම් දාම කළමණාකරණය ශක්තිමත් කිරීම.

15. කෘෂි පාදක කර්මාන්ත

15.1. පෞද්ගලික අංශයේ සහාය සහිතව කෘෂි පාදක කර්මාන්ත සහ නිෂ්පාදන විවිධාංගිකරණය ප්‍රවර්ධනය කිරීම.

16. සාම්ප්‍රදායික කෘෂිකාර්මික බෝග සහ ක්‍රමවේද

16.1. පෝෂණ හා ඖෂධීය ගුණය පරමාර්ථ කොට ගෙන ආහාර සැකසීම හා කල්තබා ගැනීම, පළිබෝධ පාලනය සහ කාබනික ගොවිතැන පිළිබඳ කෘෂිකර්මාන්තයට සම්බන්ධ සම්ප්‍රදායික දැනුම සුරැකීම ප්‍රවර්ධනය හා බෙදා හැරීම සහ එවැනි දැනුම ගොවි ප්‍රජාව අතර හුවමාරු කර ගැනීම පහසු කිරීම.

17. ගෙවතු වගාව

17.1. පවුලේ පෝෂණය සහ ආදායම ඉහළ නැංවීමට ගෙවතු වගාව සහ නාගරික කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.

17.2. ගෙවතු වගාව කෙරෙහි කාන්තා දායකත්වය ප්‍රවර්ධනය කිරීම.

18. කෘෂිකාර්මික ආයෝජනය

18.1. කෘෂිකර්මික අංශයේ වේගවත් සහ තිරසාර වර්ධනය සඳහා ප්‍රමාණවත් පරිදි ආයෝජනය කිරීම.

18.2. විශේෂයෙන්ම බීජ සහ රෝපණද්‍රව්‍ය නිෂ්පාදනය, කෘෂිකාර්මික පර්යේෂණ සහ සංවර්ධනය, මානව සම්පත් සංවර්ධනය, පසු අස්වනු කළමණාකරණය, අපනයන ප්‍රවර්ධන සහ කෘෂිකාර්මික ව්‍යවසායකත්වය යන ක්ෂේත්‍ර වල පෞද්ගලික අංශයේ ආයෝජන දිරි ගැන්වීම.

19. ආයතනික සංවර්ධනය

19.1. කෘෂිකර්මය සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්හි නියැලි සිටින රජයේ සහ පළාත් සභා ආයතන අතර පවත්නා සම්බන්ධීකරණ කටයුතු සඳහා යාන්ත්‍රණයක් ඇති කිරීම.

19.2. කෘෂිකාර්මික සංවර්ධනය සහ එහි ශක්තිමත්භාවය සඳහා සියලුම ප්‍රජා මූලික සංවිධානයන්හි සක්‍රිය දායකත්වය තහවුරු කිරීම.

20. පැළෑටි ජාන සම්පත් උපයෝගිතාව සහ හුවමාරු කර ගැනීම

20.1. බෝග අභිජනනය සහ වැඩි දියුණු කිරීමේ වැඩසටහන සඳහා බෝග ප්‍රභේද සහ ඒවායේ වන දර්ශ එක්රැස් කිරීම සහ සංරක්ෂණය.

20.2. බෝග ජාන සම්පත් පරිබාහිර සංරක්ෂණය සඳහා තෝරාගත් ස්ථානයන්හි විවිධ වගා ක්‍රම වැඩි දියුණු කිරීම සහ පවත්වාගෙන යාම.

20.3. බෝග ජාන සම්පත් උපයෝජනය සඳහා ගොවි සහභාගිත්ව අභිජනන ක්‍රමවේද භාවිතා කිරීම.

20.4. අන්තර්ජාතික ගිවිසුම් හරහා ජාන සම්පත් වෙනත් රටවල් සමඟ උපයෝජනයේදී සහ හුවමාරුවේදී ජාතික අනන්‍යතාව සුරක්ෂිත කර ගැනීම සඳහා සුදුසු ක්‍රමෝපායන් පිලිපැදීම.

21. කෘෂිකර්මාන්තය කෙරෙහි තරුණ දායකත්වය

21.1. කෘෂිකාර්මික සහ ඊට අදාළ ව්‍යාපාර වලදී තරුණ දායකත්වය සක්‍රියව ලබාගැනීම සඳහා තරුණ සංවිධාන ප්‍රවර්ධනය කිරීම.

21.2. ග්‍රාමීය මට්ටමෙන් රැකිරක්ෂා අවස්ථා සුලභ කිරීම හා තරුණ දායකත්වය ලබාගැනීම සඳහා වැඩි වටිනාකමකින් යුත් බෝග හඳුන්වාදීම සහ ඊට අදාල කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම.

21.3. කෘෂිකාර්මික සහ ඊට අදාළ කර්මාන්ත ප්‍රවර්ධනයට තරුණ ව්‍යවසායකයින්ට සහනාධාර සහ ප්‍රදාන ලබාදීම.

22. කෘෂිකාර්මික අපනයන

22.1. සියලුම ආකාරයේ කෘෂි පාදක අපනයන ප්‍රවර්ධනය කිරීම.

22.2. කෘෂිකාර්මික අපනයන ප්‍රවර්ධනය සඳහා රජයේ ආයතන, කෘෂිකර්මික නිෂ්පාදකයින්, අලෙවිකරුවන් හා වෙළඳ අංශය අතර සම්බන්ධීකරණ යාන්ත්‍රණයන් පිහිටුවීම.

22.3. අන්තර්ජාතික ආහාර සුරක්ෂිතතා ප්‍රමිතීන් සපුරාලීමට හැකි වන ලෙස අපනයන විභවයෙන් යුත් බෝග සඳහා ආහාර සුරක්ෂිත සහ තත්ත්ව සහතික යාන්ත්‍රණ පිහිටුවීම.

22.4. කෘෂිපාදක භාණ්ඩ අපනයනය සඳහා පෞද්ගලික හා රාජ්‍ය අංශය දිරිමත් කිරීම.

22.5. අන්තර් ජාතික වෙළඳ පොළ පිළිගන්නා ගුණාත්මයෙන් යුත් නිමි භාණ්ඩ නිෂ්පාදනයට පහසුකරණය.